වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන

# වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමැතිය දුන් දිනය 1995.12.31)

වයඹ පළාත තුළ ක්‍රියාත්මක වන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා සම්බන්ධීකරණය කොට විධිමත් කිරීම සඳහාද, එවැනි විධිමත් කිරීමේ කර්තව්‍යයන් ඉටු කරනු වස් වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහාද, ඒ අධිකාරියේ බලතල හා කාර්යයන් නිශ්චය කොට දැක්වීම සඳහාද, වයඹ පළාතේ 1992 අංක 03 දරන බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය අවලංගු කිරීම සඳහාද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක වන්නේ ය.

## 1 වන කොටස

## වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය

**වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම.**

2. මෙහි මින්මතු "පළාත් අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

**පළාත් අධිකාරිය සංස්ථාපිත ආයතනයක් බව.**

3. පළාත් අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති දෙවැනි වගන්තියෙන් දී ඇති නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට හැකි සංස්ථාපිත ආයතනයක් වේ.

**ශාඛා කාර්යාල.**

4. අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව පළාත් අධිකාරිය විසින් ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකිය.

...( 2

**පළාත් අධිකාරියේ සාමාජිකයෝ.**

5. පළාත් අධිකාරිය මතු දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(1) මගී ප්‍රවාහනය, වාණිජ්‍යය, නීතිය, මුදල් හෝ පරිපාලන කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇතැයි සහ ඒ සම්බන්ධයෙන් පරිණතභාවයක් පෙන්වා ඇතැයි අමාත්‍යවරයාට හැඟී යන තැනැත්තන් හතරදෙනෙක්.

(2) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්.

(3) ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ස්වකීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්.

(4) වයඹ පළාතේ නියෝජ්‍ය පොලිස්පති විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරීවරයෙකු හෝ ඊට උසස් තත්ත්වයේ පොලිස් නිලධාරියෙක්.

**නුසුදුසුකම්.**

6. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත්පාලන ආයතනයක සභිකයකු හෝ අධිකාරියේ සාමාජිකයකු ලෙස පත්වීමට හෝ කටයුතු කිරීමට හෝ සුදුස්සකු නොවන්නේ ය.

**කොන්ත්‍රාත්තු සම්බන්ධතා.**

7. පළාත් අධිකාරිය විසින් ඇතුළත් වන්නාවූ හෝ ඇතුළත් වීමට අදහස් කරන්නාවූ හෝ යම් කොන්ත්‍රාත්තුවකට කෙලින්ම හෝ අනියම් වශයෙන් හෝ යම් ආකාරයක සම්බන්ධතාවක් ඇති පළාත් අධිකාරියේ කවර හෝ සාමාජිකයකු විසින් ඔහුගේ එම සම්බන්ධතාවයේ ස්වභාවය පළාත් අධිකාරියේ රැස්වීමකදී අනාවරණය කළයුතු අතර, එම අනාවරණය කිරීම පළාත් අධිකාරියේ රැස්වීම් වාර්තාවෙහි වාර්තාගත කළ යුතුය. තවද ඒ සාමාජිකයා පළාත් අධිකාරියේ ඒ කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ සහභාගි නොවිය යුතුය.

**සාමාජිකයන්ගේ ධුර කාලය:**

8. නියමිත කාලයට පෙර තනතුර අත්හැරියහොත් හෝ 11 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ හැර පළාත් අධිකාරියේ සෑම සාමාජිකයකුම තම පත්වීමේ දිනයෙහි සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරයි.

එතෙකුදු වුවත් සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් පිරවීමට පත්කළ සාමාජිකයකු, ධුරය දරන්නේ තම පූර්වගාමියාගේ ධුර කාලයේ ඉතිරි කාලපරිච්ඡේදය සඳහා පමණි.

... 3

**වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.**

9. අසනීප නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය රාජකාරි ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම් එසේ අසනීප වන කාලසීමාව සඳහා 5 වැනි හා 6 වැනි වගන්තිවල විධිවිධානයන්ට යටත්ව අමාත්‍යවරයා විසින් සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට වෙනත් අයෙකු පත්කළ හැක.

**ඉල්ලා අස්වීම.**

10. අමාත්‍යවරයා වෙත තම කාර්ය සඳහා කරන ලිඛිත දැන්වීමක් මඟින් පළාත් අධිකාරියේ කවර හෝ සාමාජිකයකු කවර අවස්ථාවක වුවද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක.

**ධුරයෙන් ඉවත් කිරීම.**

11. අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක, හේතු නොදක්වා, ඕනෑම සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැක.

**නැවත පත් කිරීම.**

12. කාලයාගේ ඇවෑමෙන් තනතුරෙන් ඉවත්වන සාමාජිකයකු නැවත පත් කරනු ලැබිය හැකිය. එතෙකුදු වුවත් 11 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නැවත පත්වීමට සුදුස්සකු නොවේ.

**පළාත් අධිකාරියේ සභාපති.**

13. (1) පළාත් අධිකාරියේ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පළාත් අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතුය.

(2) සභාපතිවරයාගේ ධුර කාලය 11 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව පළාත් අධිකාරියේ ඔහු සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතුය.

(3) 9 වැනි වගන්තියේ සඳහන් කර ඇති හේතුවක් නිසා, සභාපතිවරයාට සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, සභාපතිවරයා ලෙස වැඩ බැලීම පිණිස වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

**පාරිශ්‍රමික.**

14. පළාත් අධිකාරියේ සාමාජිකයන්ට හා සභාපතිවරයාට පළාත් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමික පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැක.

**පළාත් අධිකාරියේ කටයුතු කිරීම.**

15. (1) පළාත් අධිකාරියේ සභාපතිවරයා සහභාගි වන අධිකාරයේ සෑම රැස්වීමකම ඔහු මුලාසනය දැරිය යුතුය. පළාත් අධිකාරයේ යම් රැස්වීමකට සභාපතිවරයා සහභාගි නොවන අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත්කර ගන්නා යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලාසනය දැරිය යුතුය.

(2) අධිකාරය අවම වශයෙන් මසකට වරක් වත් රැස්විය යුතුය. රැස්වීම අවශ්‍ය යයි පළාත් අධිකාරියේ සභාපතිවරයා සලකන ඕනෑම අවස්ථාවකදී හෝ අධිකාරයේ සාමාජිකයන් තුන්දෙනෙකු විසින් ලිඛිත ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී හෝ පළාත් අධිකාරයේ රැස්වීමක් සභාපතිවරයා විසින් කැඳවිය යුතුය.

(3) පළාත් අධිකාරියේ යම් රැස්වීමක මුලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) පළාත් අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතුය.

(5) පළාත් අධිකාරියේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණද ඒ නොතකා පළාත් අධිකාරියට ක්‍රියා කළ හැකි අතර, අධිකාරියේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන්ම පමණක් පළාත් අධිකාරියේ යම් ක්‍රියාවක් නිර්බල නොවන්නේය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව පළාත් අධිකාරයේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය සම්බන්ධව කාර්ය විධානයකට අදාළව පළාත් අධිකාරිය විසින් රීති සෑදිය හැකිය.

**පළාත් අධිකාරියේ මුද්‍රාව.**

16. (1) පළාත් අධිකාරියේ මුද්‍රාව, පළාත් අධිකාරයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරගත හැකිය.

(3) පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතුය. ඒ සාමාජිකයන් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු පළාත් අධිකාරියේ සභාපතිවරයා විය යුතුය. තමන් ඉදිරිපිටදී මුද්‍රාව තැබූ බවට සාක්ෂියක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් තැබිය යුතුය.

## II වන කොටස

### පළාත් අධිකාරියේ බලතල හා කාර්ය :

පළාත් අධිකාරියේ බලතල හා කාර්ය.

17. පළාත් අධිකාරියට පහත සඳහන් බලතල හා කාර්යයන් පැවරේ.

(අ) වයඹ පළාත ඇතුළත මහජන මගී ප්‍රවාහන අවශ්‍යතා වලට සරිලන මනා තත්ත්වයක බස් සේවයක් පවතින්නේද යන්න පිළිබඳව සොයා බැලීම සහ ධාවන කාලසටහන් පිළියෙල කිරීම හා ධාවකයින් එම කාලසටහන් පිළිපදින බවට වග බලා ගැනීමට පියවර ගැනීම හා වයඹ පළාත තුළ මගී ප්‍රවාහනය සඳහා බස්රථ යෙදිය යුතු මාර්ග අනුමත කිරීම, වර්ග කිරීම හා බස් මාර්ගවල බස් නැවතුම් පලවල් ඉදිකිරීම තීරණය කිරීම.

(ආ) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත් නිකුත් කිරීම, ඒ අවසරපත් අවලංගු කිරීම හෝ අවලංගු කිරීම සහ අවසර පත් නිකුත් කිරීම සඳහා ගාස්තු නියම කිරීම.

(ඇ) මගී සේවා අවසර පත් නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසි වලට යටත්වද, ඒ කොන්දේසි පිළිපදින බවට වග බලා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

(ඈ) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක කළයුතු හා ඉටු කළයුතු බලතල හා කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වාර්තා හා වෙනත් තොරතුරු සපයන ලෙස මගී සේවා අවසර පත්‍රධාරීන්ට නියම කිරීම.

(ඉ) කොන්දොස්තර බලපත්‍ර නිකුත් කිරීම හා රියදුරන් ලියා පදිංචි කිරීම.

(ඊ) මගීන්ගේ ආරක්ෂාව හා සැප පහසුව සහතික කිරීම සඳහා විශේෂයෙන්ම මෙහි පහත දැක්වෙන කාරණා සියල්ලටම හෝ ඉන් යම් කාරණයකට හෝ අදාළව නියෝග සකස් කිරීම හා ඒවා බලාත්මක කිරීම. එනම්,

(I) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල බලය යටතේ ධාවනය කරන බස්රථවල තිබිය යුතු පුවරු හා සළකුණු.

(II) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල බලය යටතේ ධාවනයේ යොදවන බස්රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් ඒගෙන යා යුතු ලියකියවිලි හා ඒවායේ ඇතුළත් කළයුතු විස්තර.

.../6

(iii) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ බස් රථයක් ධාවනයේ යොදවන තැනැත්තකු විසින් පිළිපැදිය යුතු ප්‍රමිති නියම කිරීම සහ ඒ ප්‍රමිති උල්ලංඝණය වන ක්‍රියා හෝ නොකර හැරීම් තහනම් කිරීම.

(iv) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ ධාවනයේ යොදවන බස්රථයක ගමන් වාර සම්බන්ධව තබාගත යුතු වාර්තා.

(v) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රධාරියකු විසින් ඒ අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස්රථවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් ලෙස සේවයේ නියුක්ත කරන තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා නිම කරන වේලාවන් හා ඔවුන්ට ලැබෙන ගිමන් හැරීම් විවේක කාලයන් සම්බන්ධයෙන් හා ඔවුන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් අවසර පත්‍රධාරියා විසින් තබාගත යුතු වාර්තා සහ වේලා සටහන්-කරුවන් සහ ස්ථාන පාලකවරුන් වෙනුවෙන් පළාත් අධිකාරිය විසින් තබාගත යුතු වාර්තා.

(vi) මේ ප්‍රඥප්තිය යටතේ තබන වාර්තා ආරක්ෂා කිරීම, නියෝග වලින් නිශ්චිතව නියමිත යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම, එසේ පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ වාර්තා එකී බලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීම.

(ඏ) බස් නැවතුම්පලවල් සහ බස් මගී ආවරණ සෑදීම සහ/හෝ පළාත්පාලන ආයතන විසින් ඒවා ඉදිකිරීම පිළිබඳව උපදෙස් දීම හා අධීක්ෂණය කිරීම.

(ඐ) බස් ධාවකයන්ට විශේෂ උපදෙස් හා මාර්ගෝපදේශනත්වය සැපයීම.

(එ) මෙහි සඳහන් බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු කොන්ත්‍රාත් වලට හෝ ගිවිසුම් වලට හෝ ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම හෝ සපුරාලීම.

(ඒ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම හෝ අත්කර ගන්නා ලද හෝ දරන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් බැහැර කිරීම.

(ඔ) පළාත් අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම.

(ඕ) මුදලින් හෝ අන්‍යාකාරයෙන් වූ ප්‍රදාන, හෝ සහනාධාර පිළිගැනීම සහ පළාත් අධිකාරියේ කටයුතු හෝ අරමුණු අරභයා ඒවා යොදා ගැනීම සහ,

(ක) රියදුරු අභ්‍යාස පාඨමාලා පැවැත්වීම හා බලපත්‍ර ලබාදීම.

(ග) විධිමත් බස් සේවාවන් පවත්වා ගැනීම පිළිබඳව පිළිගත් දේශීය හෝ විදේශීය ආයතන වලින් උපදෙස් ලබා ගැනීම.

(ජ) අධිකාරියේ සේවකයන් සම්බන්ධ විනය කාර්ය පරිපාටියක් සකස් කිරීම.

...7

(ට) මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම් සම්බන්ධව වූ හෝ ඊට ආනුෂංගික වූ සියළු හෝදේවල් කිරීම.

(ඊ) වගන්තිය යටතේ සාදනු ලබන නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒවා එහි නිශ්චය කොට දැක්වෙන දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

**විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.**

18. (1) අධිකාරිය විසින් එහි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් පළාත් අධිකාරියට කලින් කල අමාත්‍යවරයා විසින් පොදු හෝ විශේෂ හෝ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, පළාත් අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතුය.

(2) පළාත් අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සපයන ලෙස පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල ලිඛිත විධාන කරනු ලැබිය හැකි අතර, පළාත් අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කළ යුතුය.

**පළාත් අධිකාරියේ බලතල පැවරීම.**

19. පළාත් අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඊට අයත් බලතල හා කාර්ය අතුරෙන් කිසිවක් අධිකාරියේ සභාපතිවරයා වෙත හෝ එහි යම් නිලධරයකු වෙත ලිඛිතව පවරා දිය හැකිය.

**නිත්‍ය සේවා සඳහා මගී සේවා අවසර පත්‍ර.**

20. (1) මෙහි (2) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව කිසිම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින හෝ ඉන්පසුව පළාත් අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලද්දා වූ සහ තත්කාලයෙහි බලාත්මකව පවතින්නා වූ මගී සේවා අවසර පත්‍රයක් යටතේ හැර ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීම පිණිස පළාත ඇතුළත වන නිත්‍ය සේවාවක් සඳහා බස්රථයක් පළාත ඇතුළත ධාවනය නොකළ යුතුය. එසේ ධාවනය කිරීම මේ ප්‍රඥප්තිය යටතේ දඬුවම් කළ හැකි වරදක් වන්නේය.

(2) පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයන් සම්බන්ධයෙන් 1992 අංක 3 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර සහ බස්රථ ධාවකයන් විසින් දැනට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාලසීමාවකටද, ඒ කාලසීමාව සඳහා ඒ අවසර පත්‍ර වලංගු වන්නේය.

(3) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේදී හෝ ඉන්පසුව කිසිම තැනැත්තකු විසින් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මහාමාර්ග ඔස්සේ මගී ප්‍රවාහනය කිරීමේ නිත්‍ය සේවය සඳහා බස්රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය. එසේ ධාවනය කිරීම මේ ප්‍රඥප්තිය යටතේ දඬුවම් කළ හැකි වරදක් වන්නේය.

(4) මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් පළාත් අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කරන ලද පැමිණිල්ලක් මත යම් පොලිස් නිලධරයෙකු විසින් තහනමකට ගත හැකි අතර, ඒ වාහනය එසේ තහනමට ගනු ලැබුයේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය ඇතුළතදද, ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඒ වාහනය ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(5) යම් වාහනයක් (4) වන උප වගන්තියේ විධිවිධාන යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසන් කරන තෙක් ඒ වාහනය රඳවා තබන අඥාවක් හෝ නඩුවට අදාළ අවස්ථාගත කරුණු අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ඒ වාහනය මුදා හරින අඥාවක් හෝ කළ හැකිය.

බස්රථ වලින් මගී ප්‍රවාහනයට හිමිකම.

21. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින් ඒ අවසර පත්‍රයේ නිශ්චිත සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගී ප්‍රවාහනය සඳහා නිත්‍ය සේවයක් පවත්වාගෙන යාම පිණිස ඒ අවසර පත්‍රධාරියා ලියා පදිංචි අයිතිකරු වන බස්රථයක් ඒ අවසර පත්‍රයට අදාළ කොන්දේසි වලට අනුකූලව යොදා ගැනීමට ඒ අවසර පත්‍ර-ධාරියාට හිමිකම් ලැබෙන්නේය.

මගී සේවා අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

22. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නේ යම් බස්රථයක් සඳහාද, ඒ බස්රථයේ ලියා පදිංචි අයිතිකරු විසින් පළාත් අධිකාරිය වෙත නියමිත ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රය සමඟ පහත දැක්වෙන විස්තර ඇතුළත් නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක්ද ඉදිරිපත් කළ යුතුය.

.../9

(අ) ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ගෙන යාම පිණිස ඒ බස්රථය ධාවනයට යොදා ගැනීමට යෝජිත මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර,

(ආ) 23 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පළාත් අධිකාරිය ඉල්ලා සිටින වෙනත් විස්තර.

මගී සේවා අවසර පත්‍රයක් ගැන කටයුතු කිරීමට පළාත් අධිකාරියට ඇති බලය.

23. (1) මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් හෝ එය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් හෝ පූර්ණ බලතල හා අභිමතය (2) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පළාත් අධිකාරියට ඇත්තේය.

(2) මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේදී හෝ එය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමේදී හෝ එය අලුත් කිරීමේදීද අවසර පත්‍ර ප්‍රදානය කළ හැකි මාර්ගය හෝ මාර්ග සම්බන්ධයෙන්ද ස්වකීය අභිමතය පාවිච්චි කිරීමේදී පළාත් අධිකාරිය ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගී ප්‍රවාහන සේවා පහසුකම් අවශ්‍ය තැනැත්තන් මෙන්ම ඒ පහසුකම් සපයන තැනැත්තන්ද ඇතුළුව පොදු මහජනයාගේ යහපත පිළිබඳව මූලික වශයෙන් සැලකිලිමත් විය යුතු අතර, විශේෂයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

(අ) යෝජිත පරිදි මගීන් ප්‍රවාහනය කිරීම පොදු යහපත පිණිස කොතෙක් දුරට අවශ්‍ය ද යන වග,

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාව.

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ ඉන් යම් මාර්ගයක හෝ දැනටමත් මගී ප්‍රවාහන සේවයක් ඇත්නම් එය කොතෙක් දුරට ප්‍රමාණවත්ද යන වග.,

(ඈ) සමස්ත වශයෙන් ගමනාගමන පහසුකම් වලට අදාළව ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් කෙරෙන ප්‍රවාහනය ඇතුළුව සියලු ආකාරයේ මගී ප්‍රවාහන සේවා සම්බන්ධීකරණය,

(ඉ) යම් ප්‍රදේශයක හෝ යම් මාර්ගයක ඇති ප්‍රවාහන පහසුකම් පළාත් අධිකාරියේ මතය අනුව ඒ ප්‍රදේශයේ හෝ ඒ මාර්ගය ඔස්සේ මහජනයා සඳහා පවත්නා ප්‍රවාහන අවශ්‍යතා සාධාරණ ප්‍රමාණයකට සපුරාලීමට තරම් සතුටුදායක නම් සහ කාර්යක්ෂම නම් ප්‍රධාන වශයෙන්ම එම ප්‍රදේශයෙහිම හෝ ප්‍රධාන වශයෙන් එම මාර්ගය ඔස්සේම එක් ප්‍රවාහන පහසුකම් සමඟ තරඟකාරී මගී ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේ යෝග්‍යතාවය.

...( 10

මඟී සේවා අවසර පත්‍රයක වලංගු කාලය.

24. (1) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් හැර පළාත් අධිකාරය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මඟී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(2) සෑම මඟී සේවා අවසර පත්‍රයක්ම,

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය.

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කරන ලද දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් සඳහා වලංගුව පවතින්නේය.

අවසර පත්‍රයකට අදාළ කළයුතු කොන්දේසි.

25. මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධාන වලට යටත්ව මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මඟී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව සහ සැප පහසුව පිණිස පහත සඳහන් කරුණු නියම කරන්නා වූ කොන්දේසි ඇතුළුව පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සියළු කොන්දේසි ඇතුළත් කරනු ලැබිය හැක.

(අ) අය කරන ගාස්තු මඟී සේවා අවසර පත්‍රය සඳහා වූ අයදුම් පත්‍රයේ සඳහන් කළයුතු බව.

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස්රථය අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල ධාවනයේ යෙදවිය යුතු බව.

(ඇ) කාලසටහනෙහි හා ගමන් ගාස්තු වක්‍රයෙහි පිටපත් අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස්රථයේ රැගෙන යා යුතු බව සහ එහි තුළ ප්‍රදර්ශනය කර තැබිය යුතු බව.

(ඇ) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස්රථය සියළු අවස්ථාවන්හිදී ධාවනයට සුදුසු හා යෝග්‍ය තත්ත්වයකින් පවත්වා ගත යුතු බව.

(ඉ) බස්රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව සේවයේ නිරතව සිටිය හැකි කාලය සහ ඔවුන්ගේ වැඩ කරන පැය ගණන හා විවේක කාල සම්බන්ධයෙන් හා ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක ඇති නියමයන් අවසර පත්‍රයේ බලයයටතේ ධාවනයේ යොදවන බස්රථයේ රියදුරු සහ කොන්දොස්තරවරයා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු බව.

...| 11

**අවසර පත්‍රයේ විස්තර දැක්වීම.**

26. පළාත් අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ මඟී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරන අවස්ථාවේදී ධාවනයේ යෙදීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන මාර්ගය එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි පළාත් අධිකාරිය සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන් නිශ්චිත වශයෙන් අවසර පත්‍රයේ දක්වනු ලැබිය යුතුය.

**විධාන නිකුත් කිරීමට පළාත් අධිකාරියට බලය ඇති බව.**

27. මේ ප්‍රඥප්තිය යටතේ මඟී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ කවර හෝ තැනැත්තෙකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන අනුව ක්‍රියා කරන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි පළාත් අධිකාරිය අදහස් කරන විධාන ඒ තැනැත්තාට නිකුත් කළ හැකි අතර, ඒ විධාන නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකුටද, ඒ තැනැත්තා විසින් ඒ විධානවල නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ විධාන අනුව ක්‍රියා කළ යුතුය.

**අවසර පත්‍රය පැවරිය නොහැකි බව.**

28. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබ, මඟී සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේය.

**අවසර පත්‍රධාරියා විසින් විස්තරවල වෙනසක් පළාත් අධිකාරිය වෙත දැනුම් දිය යුතු බව.**

29. මඟී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍රධාරියා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදුවූ දින සිට දින 30 ක් ඇතුළත ඒ අවසර පත්‍රධාරියා විසින් ඒ වෙනස පිළිබඳව පළාත් අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දී එහි එකඟත්වය ලිඛිතව ලබාගත යුතුය.

**අවසර පත්‍රය අවලංගු කිරීම.**

30. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී සේවා අවසර පත්‍ර ධාරියෙකු විසින් පළාත් අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට,

(අ) ඒ මඟී සේවා අවසර පත්‍රධාරියා මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ නොමැති බවට පළාත් අධිකාරිය සෑහීමකට පත් වන්නේ නම් සහ,

(ආ) මඟී සේවා අවසර පත්‍රධාරියා අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන්නේ නම්,

ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට මාස 12 ක කාලයක් සඳහා ඒ අවසර පත්‍රය පළාත් අධිකාරිය විසින් අලුත් කරනු ලැබිය හැකිය.

අවසර පත්‍රය අවලංගු කිරීම.

31. (1) මඟී අවසර පත්‍රධාරියා විසින්,

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් හෝ උල්ලංඝණය කර ඇති බව,

(ආ) 27 වන වගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද විධානයක් අනුව ඔහු ක්‍රියා කර නොමැති බවට හෝ,

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක හෝ අසත්‍ය යයි නැතහොත් වැරදි යයි තමන් දන්නා යම් විස්තර ඔහු විසින් සපයා ඇති බවට,

පළාත් අධිකාරිය සෑහීමට පත්වූවහොත් යම් මඟී සේවා අවසර පත්‍රයක් අධිකාරිය විසින් අවලංගු කරනු ලැබීම හෝ වෙනත් අඩුවමකට ඔහු යටත් කිරීම හෝ කළ හැකිය.

(2) පළාත් අධිකාරියේ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකි කාලය ඉකුත් වනතෙක් හෝ අභියාචනයක් කර ඇත්නම් ඒ අභියාචනය පිළිබඳව සුදුස්සක් කරනු ලබන තෙක් (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතුය.

පළාත් අධිකාරියේ තීරණය සහ ඊට හේතු ඉල්ලුම්කරුට හෝ අවසරපත්‍රධාරියාට දැනුම් දිය යුතු බව.

32. පළාත් අධිකාරිය විසින් මඟීසේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක පළාත් අධිකාරිය විසින් එහි තීරණය සහ ඊට හේතුද අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රධාරියාට ලිඛිතව දැනුම් දිය යුතුය.

අභියාචනය.

33. (අ) මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ,

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින් හෝ

පළාත් අධිකාරිය විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්ත වන්නා වූ යම් ඉල්ලුම්කරුවෙකු හෝ මගී සේවා අවසර පත්‍රධාරියෙකු හෝ විසින් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ කටයුතු කළ හැකිය.

අවසර පත්‍රය ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතු බව.

34. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මගී සේවා අවසර පත්‍රයක්ම ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් බස්රථයක් සඳහා ද ඒ බස්රථයේ ඉදිරිපස වීදුරුවේ පැහැදිළිව පෙනෙන අයුරු ප්‍රදර්ශනය කළ යුතුය.

අධිකාරියට තොරතුරු හා වාර්තා සැපයීම.

35. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා පළාත් අධිකාරියට අවශ්‍ය වන යම් වාර වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිළි කිරීමේ දැන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුළත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකුට පළාත් අධිකාරිය විසින් ලියවිල්ලකින් දැන්වීමක් කළ හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේය.

## III කොටස

### පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලය

පළාත් අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයා.

36. (1) පළාත් අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරීවරයකු පත් කරනු ලැබිය යුතුය.

(2) පළාත් අධිකාරියේ එදිනෙදා වැඩ කටයුතු මෙහෙයවීමද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනයද, අධිකාරියේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත්ව සාමාන්‍යාධිකාරීවරයාට භාර කරනු ලැබිය යුතුය.

.../ 14

(3) මේ ප්‍රඥප්තියෙන් අධිකාරියට පැවරෙන යම් බලතල හා කර්තව්‍යයන් අතුරෙන් කාර්යක්ෂම පරිපාලනයට අවශ්‍ය යයි අධිකාරිය අදහස් කරන බලතල හා කර්තව්‍යයන් පළාත් අධිකාරිය විසින් වරින්වර සාමාන්‍යාධිකාරිවරයාට පවරා දිය හැකිය. සාමාන්‍යාධිකාරිවරයා එවැනි බලතල පළාත් අධිකාරියේ මග පෙන්වීම හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

(4) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් පළාත් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය පළාත් අධිකාරියේ ලිඛිත අනුමැතිය ඇතිව සාමාන්‍යාධිකාරිවරයා විසින් ලිඛිතව ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන වලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

(5) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරි-වරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතුය.

පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය.

37. (1) පළාත් අධිකාරිය විසින්,

(අ) පළාත් අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන කාර්ය මණ්ඩලයක් පත් කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම,

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම,

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කළ හැකිය.

(2) වයඹ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ තාවකාලික හෝ ස්ථිර හෝ තනතුරකට පත් කිරීමට අවශ්‍ය යයි අධිකාරිය තීරණය කරනු ලබන අවස්ථාවකදී එකී නිලධාරියාගේ කැමැත්තද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ අනුමැතියද ඇතිව පත් කළ හැකිය.

(3) පළාත් අධිකාරියේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධාරියකු එම නිලධාරියාගේද, එම නිලධාරියා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින්ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේද එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්-වරයාගේද කැමැත්ත ඇතිව පළාත් අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(4) නිශ්චිත කාලසීමාවක් රජයට හෝ පළාත් සභාවකට හෝ සේවය කිරීමට එකඟ වෙමින් රජය හෝ පළාත් සභාවක් සමඟ හෝ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු පළාත් අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා පළාත් අධිකාරියට සේවය කරන යම් සේවා කාලයක් රජයේ හෝ පළාත් සභාවේ එකඟත්වයට යටත්ව ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට හෝ එම පළාත් සභාවට හෝ කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතුය.

## IV වන කොටස

## මුදල්

පළාත් අධිකාරියේ අරමුදල.

38. (1) පළාත් අධිකාරියට අධිකාරයේම අරමුදලක් තිබිය යුතුය.

(2) පළාත් අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය.

(අ) මඟී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම මත අය කරනු ලබන මුදල් හා ස්වකීය බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී පළාත් අධිකාරියට ලැබෙන සියළු මුදල් ප්‍රමාණයන්,

(ආ) වයඹ පළාතේ පළාත් සභාවෙන් ලැබෙන ආධාර මුදල්ද ඇතුළුව අධිකාරයේ බැරට උපචිත සියළු මුදල්.

(3) මෙම මුදල් නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම් ගත කිරීම සාමාන්‍යාධිකාරිවරයා සතු වගකීමකි.

(4) මේ ප්‍රඥප්තිය සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පළාත් අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරම අධිකාරියේ සාමාජිකයන්ට හා අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීම් පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් වියදම් ගෙවීමේ කාර්ය සඳහා සහ කලින්කල අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්ය සඳහා පළාත් අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කරගත හැකිය.

**අධිකාරියේ ණය ගැනීමේ බලතල.**

39. මේ ප්‍රඥප්තිය යටතේ පළාත් අධිකාරියේ කාර්ය ඉටු කිරීමේදී සිය වගකීම ඉටු කිරම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල් පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව බැංකු අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් ණයට ගත හැකිය.

**පළාත් අධිකාරියේ ගිණුම්.**

40. (1) පළාත් අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) පළාත් අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතුය.

(3) පළාත් අධිකාරිය එහි ගිණුම් වාර්ෂිකව විගණනය කරවිය යුතුය. මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයෙක් මගින් එම විගණනය කරවා ගත යුතුය.

(4) පළාත් අධිකාරිය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්ෂික වාර්තාවක් අධිකාරිය විසින් සකස් කළ යුතුය.

(5) පළාත් අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ විගණන වාර්තාව අමාත්‍යවරයා විසින් මුදල් වර්ෂය ඉකුත් වී මාස 09 ක් ගතවීමට පෙර පළාත් සභාවෙහි සභාගත කළ යුතුය.

....| 17

## V වන කොටස

## පොදු විධිවිධාන

නියෝග සෑදීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

41. (1) පළාත් අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සහ මගී ප්‍රවාහන සේවයේ යෙදෙන සියලු සේවකයින්ට අදාළ අවම වැටුප්, නිවාඩු සහ සේවක වරප්‍රසාද පිළිබඳ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි ලා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසුව එළඹෙන දිනයක ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා වයඹ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවක් බලරහිත නොවිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අවලංගු කිරීම.

42. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 3 දරන බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය අවලංගු වන්නේය.

වැරදි සහ දණ්ඩන.

43. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

.../18

ස්ථානික දඩ ගෙවීම නියම කිරීම.

44. පළාත් අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් කඩකර ඇති ලෙස සොයා ගනු ලැබීමේදී ඒ කඩ කිරීම පිළිබඳ වගකීම පිළිගනු ලබන යම් තැනැත්තකු විසින් තමා වගකීම පිළිගෙන ඇති වරද සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ උපලේඛනයේ දක්වා ඇති දඩ මුදල ඒ වරද සඳහා නඩු පැවරීම වෙනුවට ගෙවනු ලැබිය හැකිය. ඒ ගෙවීම පළාත් අධිකාරියේ කාර්යාලයකදී හෝ වයඹ පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ශාඛා කාර්යාලයකදී කළ හැකි අතර, ඒ ගෙවීම කරනු ලැබූ බවට සාක්ෂි වශයෙන් වූ ලදුපත ඒ සොයා ගැනීමෙන් පසු සති දෙකක් ඇතුළත පළාත් අධිකාරිය වෙත හෝ සොයා ගැනීම කරනු ලැබූ පොලිස් නිලධරයා විසින් නම් කරනු ලැබූ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත පෞද්ගලිකව භාර දීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව.

45. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක,

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් හෝ සමාගමක් නම් වරද සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ සංස්ථාවේ හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, ලේකම්වරයකු හෝ ඊට සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම හෝ,

(ආ) ඒ මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම් වරද සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවෙක්ම වරද සිදු කරනු ලැබුවේ එහුගේ දැනුම හෝ අප සහායකත්වය නොම[illegible] බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සියළු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළයුතුව තිබූ තිසි සියළු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

46. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

.../ 19

අර්ථ නිරූපණය.

47. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි,

" අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ ප්‍රවාහන සේවා විෂය පැවරී ඇති පළාත් අමාත්‍යවරයාද,

" බස්රථය" යන්නෙන් මෝටර් වාහන පනත යටතේ ලියා පදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් හෝ ද්විත්ව කාර්ය වාහනයක්ද,

" බස්රථ ධාවකයා" යන්නෙන් මගී බලපත්‍රධාරියා හෝ එකී බලපත්‍රයට අදාළ බස්රථයේ රියදුරු හා කොන්දොස්තරද,

" මගියා" යන්නෙන් මගී සේවා බලපත්‍රයකට අදාළ බස්රථයක ගමන් කරන, එකී බස්රථයේ රියදුරු හා කොන්දොස්තර ද හැර පුද්ගලයෙකු ද

අදහස් වේ.

## උපලේඛනය

| | රු. |
|---|---|
| පළමු වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් ස්ථාවර දඩය | - 250.00 |
| දෙවැනි වරට සහ තදනන්තරව කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් ස්ථාවර දඩය | - 500.00 |